# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# දෙවන ජාතික භාෂාව (දෙමළ)

## දෙවන ශ්‍රේණිය

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# විෂය නිර්දේශය

## දෙවන ජාතික භාෂාව (දෙමළ) - දෙවන ශ්‍රේණිය

## 1.0 හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන්, තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීම තුළින් එකිනෙකා කෙරෙහි  අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාවන් සිසුන් තුළ වර්ධනය කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

මෙම අරමුණ ඇතිව දෙවන ජාතික භාෂාවක් ඉගැන්වීම තුළින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමටත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි ද අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පළමුවන ප්‍රධාන අවධිය තුළ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් සකසා ඇත.

මෙහි දී භාෂා ක්ෂේත්‍ර යටතේ සවන් දීම හා කතා කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර ඇති අතර දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී චතුර්විධ භාෂා ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීමට සැලසුම් කර ඇත.

### පළමුවන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව නිවැරදි ව හා සුහදශීලී ව ප්‍රකාශ කරයි.
- පාසලේ දී තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සුහද ව හා ආචාරශීලී ව ඉල්ලීම් කරයි.
- පාසලේ දී ලැබෙන විධානවලට අවනතව කටයුතු කරයි.
- තමාට සමීපතමයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- අංක හඳුනාගෙන පැහැදිලි ව හා නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට හඳුනාගෙන එම පාට යෙදුණු සරල වැකි නිවැරදි උච්චාරණයෙන් යුතු ව  කියයි.
- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

### දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා

- උපන් දින හා ජයග්‍රහණ සඳහා සතුටින් සුබ පතයි.
- තමාගේ නම හා ගම නිවැරදි ව කියයි.
- තම පන්ති මිතුරන්ගෙන් ආචාරශීලී ව හා සුහද ව සරල වැකි භාවිත කරමින් ඉල්ලීම් කරයි.
- ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල දී ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.
- තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- 1 - 10 තෙක් අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට නම් කරමින් සරල වැකි කියයි.
- සරල කවි, ගී අංගචලන සහිත ව ගායනා කරයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

මෙම නිපුණතා ඉටු කර ගැනීම සඳහා අන්තර්ගත විෂය කරුණු සිසුන්ට ප්‍රියජනක ලෙස ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම ගුරුවරයාගේ කාර්යයක් වේ. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ එක් එක් නිපුණතාවය යටතේ ඉදිරිපත් කෙරෙන ක්‍රියාකාරකමක අන්තර්ගත දෙමළ භාෂා වචන/වාක්‍ය ඛණ්ඩ/ සරල වැකි එකවර ඉදිරි අවුරුද්ද පුරා විවිධ අවස්ථාවන්හි දී හඳුන්වා දීමට කටයුතු සැලසුම් කර ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

2007 වසරේ දී හඳුන්වා දීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව සිංහල සිසුන් සඳහා දෙමළ භාෂාවත්, දෙමළ සිසුන් සඳහා සිංහල භාෂාවත් දෙවන ජාතික භාෂාව වශයෙන් පළමුවන ශ්‍රේණියේ සිට ඉගැන්වීමට සැලසුම් කර ඇත. මෙය ක්‍රියාත්මක කළ යුතු ආකාරය සවිස්තරාත්මක ව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන ජාතික භාෂා කොටසට ඇතුළත් කර ඇත.

දෙවන ශ්‍රේණියට අදාළ සැලසුම් ගත සෙල්ලම් හා විනෝදජනක වැඩ සහ ක්‍රියාකාරකම් සකස් කළ යුතු ආකාරය සවිස්තරාත්මක ව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන ජාතික භාෂාව කොටසට ඇතුළත් කර ඇත.

**නිපුණතාව**

- උපන් දින හා ජයග්‍රහණ සඳහා සතුටින් සුබ පතයි.

| | |
|---|---|
| பிறந்த நாள் வாழ்த்துக்கள் | පිරන්ද නාල් වාළ්ත්තුක්කල් |
| நல் வாழ்த்துக்கள் | නල් වාළ්ත්තුක්කල් |

- තමාගේ නම හා ගම නිවැරදි ව කියයි.

| | |
|---|---|
| எனது பெயர் சமன் | එනදු පෙයර් සමන් |
| எனது ஊர் மகரகம. | එනදු ඌර් මහරගම |

- තම පන්ති මිතුරන්ගෙන් ආචාරශීලී ව හා සුහද ව සරල වැකි භාවිත කරමින් ඉල්ලීම් කරයි.

| | |
|---|---|
| பென்சிலை எடுங்கள் | පෙන්සිලෙ එඩුංගල් |
| புத்தகத்தைத் தாருங்கள் | පුත්තහත්තෙත් තාරුංගල් |
| பாட்டுக் கேளுங்கள் | පාට්ටුක් කේළුංකල් |
| பெயரைக் கூறுங்கள் | පෙයරෙක් කූරුංගල් |
| கதை சொல்லுங்கள் | කදෙ සොල්ලුංගල් |
| பாட்டுப் பாடுங்கள் | පාට්ටුප් පාඩුංගල් |

- ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල දී ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.

| | |
|---|---|
| வட்டமாக ஓடுங்கள் | වට්ටමාහ ඕඩුංගල් |
| கை தட்டுங்கள் | කෛ තට්ටුංගල් |
| பந்தை வீசுங்கள் | පන්දෙ වීසුංගල් |
| வரிசையாக நில்லுங்கள் | වරිසෛයාහ නිල්ලුංගල් |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ තොරතුරු සුහද ව විමසයි.

உங்கள் பெயர் என்ன? උංගල් පෙයර් එන්න ?
உங்களது பெயர் என்ன? උංගළදු පෙයර් එන්න ?

உங்களது ஊர் எது? උංගළදු ඌර් එදු ?
உங்கள் ஊர் எது? උංගල් ඌර් එදු ?

உங்களது அம்மாவின் பெயர் என்ன? උංගළදු අම්මාවින් පෙයර් එන්න?
உங்கள் அம்மாவின் பெயர் என்ன? උංගල් අම්මාවින් පෙයර් එන්න ?

உங்களது அப்பாவின் பெயர் என்ன? උංගළදු අප්පාවින් පෙයර් එන්න?
உங்கள் அப்பாவின் பெயர் என்ன? උංගල් අප්පාවින් පෙයර් එන්න?

- 1 - 10 තෙක් අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

ஒன்று ඔන්රු
இரண்டு ඉරණ්ඩු
மூன்று මූන්රු
நான்கு නාන්ගු
ஐந்து ඓන්දු
ஆறு ආරු
ஏழு ඒළු
எட்டு එට්ටු
ஒன்பது ඔන්පදු
பத்து පත්තු

- පාට නම් කරමින් සරල වැකි කියයි.

நீல நிறம் නීල නිරම්
மஞ்சள் நிறம் මඤ්ජල් නිරම්
சிவப்பு நிறம் සිවප්පු නිරම්
பச்சை நிறம் පච්චෛ නිරම්
நாவல் நிறம் නාවල් නිරම්
கபில நிறம் කපිල නිරම්

வானம் நீல நிறம். වානම් නීල නිරම්
காகம் கறுப்பு நிறம். කාහම් කරුප්පු නිරම්
பால் வெள்ளை நிறம். පාල් වෙළ්ළෛ නිරම්

- සරල කවි, ගී අංගචලන සහිත ව ගායනා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.